00 218

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනපති උපාධි වැඩසටහන

අවසාන පරීක්ෂණය -2023/2024

STP9812 - අධ්‍යාපනයේ දාර්ශනික හා සමාජ විද්‍යාත්මක පදනම

කාලය - පැය තුන (03) යි.

දිනය : 2024.08.15 වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

ඕනෑම ප්‍රශ්න හතරකට **(04)** පමණක් පිළිතුරු සපයන්න.

01. (i.) සමාජානුයෝජනය යන සංකල්පය කෙටියෙන් අර්ථ දක්වන්න. (ලකුණු 05)

(ii.) ප්‍රාථමික සමාජානුයෝජන කාරකයක් ලෙස පවුලේ භූමිකාවේ විවිධතා පවුල් වර්ග අනුව විවේචනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(iii.) පාසල් සිසුන් තුළ දක්නට ලැබෙන සමාජානුයෝගී ගැටලු **පහක් (05)** නම් කර, ඉන් එකක් අවම කර ගැනීමට ගුරුවරයෙකුට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 10)

02. (i.) අධ්‍යාපනයට අදාළ සමාජ කාර්යයන් තුනක් කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

(ii.) ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපනය වැඩලෝකය හා සම්බන්ධ කිරීමට ගත් උත්සාහයක් ලෙස දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10)

(iii.) ශ්‍රී ලංකාවේ රැකියා වියුක්තිය අවම කර ගැනීමට අධ්‍යාපන පද්ධතිය තුළ ඇති කළ යුතු වෙනස්කම් **පහක් (05)** විග්‍රහ කරන්න. (ලකුණු 10)

03. (i.) සමාජ වෙනස් කිරීමේ කාරකයක් ලෙස අධ්‍යාපනයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) සමාජ සවලතාව යන සංකල්පය පැහැදිලි කර, ශ්‍රී ලංකාවේ පාසල් සිසුන්ට සමාජ සවලතාව ලබා ගැනීමට අධ්‍යාපනය උදව් වන්නේදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 10)

(iii.) සැමට සමාන අධ්‍යාපනයක් ලබා දීමේදී ශ්‍රී ලංකාව මුහුණ දී ඇති අභියෝග **පහක් (05)** දක්වා, ඉන් එකක් අවම කර ගැනීමට අනුගමනය කළ හැකි උපාය මාර්ග විමසන්න. (ලකුණු 10)

04. (i.) අධ්‍යාපනය හා දර්ශනය යන සංකල්ප පිළිගත් නිර්වචනයක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) අධ්‍යාපන අරමුණු පිළිබඳව පෙරදිග හා අපරදිග දාර්ශනිකයන් ඉදිරිපත් කළ චින්තාවන් සංසන්දනය කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(iii.) පාසල් ශිෂ්‍යයන් අතර සාරධර්ම සංවර්ධනය කිරීම සඳහා ගුරුවරුන්ට අනුගමනය කළ හැකි ක්‍රියාමර්ග **පහක් (05)** විස්තර කරන්න. (ලකුණු 10)

05. (i.) දේශපාලන සමාජානුයෝජනය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) අධ්‍යාපනය හා මානව සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව උදාහරණ ඇසුරින් විභාග කරන්න. (ලකුණු 10)

(iii.) ශ්‍රී ලංකාවේ පහළ සමාජ පන්තික සිසුන් මුහුණ දෙන අධ්‍යාපනික ගැටලු **පහක් (05)** විමර්ශනය කරන්න. (ලකුණු 10)

06. (i.) සමකාලීන අධ්‍යාපන ක්‍රමය පිළිබඳව ජෝන් ඩුවී විසින් ඉදිරිපත් කළ ප්‍රධාන විවේචන පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii.) සූතඥ ඉගැන්වීම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේදී ජෝන් ඩුවී ඉදිරිපත් කළ ඉගැන්වීම් ක්‍රමවල අදාළත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 10)

(iii.) වර්තමාන පන්ති කාමරයේදී එම ඉගැන්වීම් ක්‍රම යොදා ගැනීමේදී ගුරුවරුන් මුහුණ දෙන අභියෝග **පහක් (05)** නම් කර, ඉන් එකක් අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 10)

- හිමිකම් ඇවිරිණි. -